



# EPS TOPIK UBT

## [විභාග ක්‍රමවේදය.]

Copyright © 2022 All rights reserved by NSDevil co.,ltd.

# 1. පිවිසුම හා හඳුනාගැනීම


## පරීක්ෂක පිවිසුම (විභාග අපේක්ෂක පිවිසුම)

① earphones නිසි ලෙස සම්බන්ධ වී ඇති බව තහවුරු කරගන්න


නිසි ලෙස සම්බන්ධ වී ඇත්නම් "O", ලෙසද එසේ නොමැති නම් "X" ලෙසද පෙන්වනු ඇත

② ඔබගේ විභාග අංකය (අවසාන අංක 8) හා උපන්දිනය (අවුරුද්ද,මාසය,දිනය) ඇතුළත් කරන්න

③ ඉන් පසු login බොත්තම ක්ලික් කරන්න




earphones විසන්ධි වී ඇත X




earphones නිසි ලෙස සම්බන්ධ වී ඇතO

# 1. පිවිසුම හා හඳුනාගැනීම


## මුහුණ හඳුනා ගැනීම

③ සාර්ථක පිවිසුමකින් පසු මුහුණ හඳුනාගැනීමේ මොඩියුලය දිස් වී ඇත.

මුහුණු හඳුනා ගැනීම සඳහා ඉදිරිපස කැමරාව භාවිතා කරන්න.

④ හඳුනාගැනීමේ අනුපාතය 80%, අඩු නම් නැවත ක්‍රියාත්මක කරන්න

* සාර්ථක නම් ස්වයංක්‍රීයව ඊළඟ පිටුවට යොමු වනු ඇත.




මුහුණ හඳුනාගැනීමේ මොඩියුලය

# 2. පරිගණක සැකසුම

## දීප්තිය/ ශබ්දය පාලනය


① දීප්තිය

ඔබගේ වටපිටාව අනුව දීප්තිය සකසන්න
ඊළඟට next බොත්තම ක්ලික් කරන්න

② ශබ්දය

1) ශබ්දය සකසා ගැනීම සඳහා ඉහළින් ඇති play බොත්තම ක්ලික් කරන්න.

※ You need to adjust the volume to move on to the next step.







දීප්තිය සැකසීම


ශබ්දය සැකසීම

# 3. විභාග නිබන්ධනය බලන්න

## නිබන්ධනය ක්‍රියාත්මක කිරීම/ මඟහැරීම (Skip)

① EPS-TOPIK UBT භාවිතා කිරීම කරන ආකාරය පිළිබඳ දැනගැනීම

② ඊළඟ පිටුවට යාමට ඉහළ දකුණු කෙළවරේ ඇති බොත්තම ක්ලික් කරන්න




# 4. විභාග දත්ත භාගත කිරීම

### තොරතුරු පරීක්ෂා කිරීම

① නම, ඡායාරූපය, විභාග අංකය, උපන්දිනය ඔබගේ සැබෑ තොරතුරු හා ගැලපේ දැයි බලන්න

** ඔබගේ කර්මාන්තයේ වෙනසක් ඇත්නම් විභාග පරීක්ෂකගෙන් විමසන්න




විභාග අපේක්ෂක තොරතුරු


# 4. විභාග දත්ත භාගත කිරීම

## විභාග තොරතුරු ලබා ගැනීම

download බොත්තම ක්ලික් කර විභාග දත්ත ලබා ගන්න

ඔබ දත්ත භාගත කරගත් පසු විභාග පරීක්ෂකගේ උපදෙස් සඳහා රැඳී සිටින්න








විභාග දත්ත භාගත කිරීම

# 4. විභාග දත්ත භාගත කිරීම

## විභාගය ආරම්භ කරන්න

③ විභාග පරික්ෂක ඔබට පරීක්ෂණය ආරම්භ කිරීමට උපදෙස් දුන් විට විභාගය ආරම්භ කරන්න




විභාගය ආරම්භ කිරීම

# 5. විභාගය පැවැත්වීම

## ප්‍රශ්න විසඳීම


**විභාග තොරතුරු**

- විභාගයේ නම
- විභාග මධ්‍යස්ථානය

**විභාග ප්‍රශ්න**

- කියවීම ප්‍රශ්න 20
- සවන්දීම ප්‍රශ්න 20

* පිළිතුරු ලබා දුන් පසු ප්‍රශ්න අංක නිල් පැහැයෙන් දිස් වේ.




**අපේක්ෂකගේ තොරතුරු**

- විභාග අංකය
- ඔබේ නම


**ඉතිරිව ඇති විභාග කාල සීමාව**

**පිළිතුරු ලබා දීම**

# 5. විභාගය පැවැත්වීම

## කියවීම ප්‍රශ්න 20

① ප්‍රශ්න සියල්ලම තිරයේ දිස් වූ විට මුලින්ම අංක 1 සිට ප්‍රශ්නය තෝරා ගන්න.





අවශ්‍යතාවය ඇතිවුවහොත් වහාම ඔබේ අත ඔසවා විභාග පරීක්ෂකට දැනුම් දෙන්න.

ප්‍රශ්නය කියවා ලබා දී ඇති පිළිතුරු 4 න් නිවැරදි පිළිතුර තෝරන්න




# 5. විභාගය පැවැත්වීම

* රූපයේ පෙනෙන පරිදි ඇඟිලිතුඩු භාවිතා කර ඡායාරූපය කුඩා විශාල කර ගත හැකිය.





③ තිරයේ දිස්වන පෙර / පසු බොත්තම භාවිතා කර ප්‍රශ්න ලබා ගත හැකිය.




සම්පූර්ණ ප්‍රශ්න අංක තිරය වෙත යාම සඳහා Total questions මත ක්ලික් කරන්න

**සවන්දීම ප්‍රශ්න 20**

④ ඔබ කියවීම ප්‍රශ්න 20 ට පිළිතුරු ලබා දීමෙන් පසු සවන්දීම ප්‍රශ්න වලට පිළිතුරු ලබා දෙන්න.




**අවධානයට**

–සවන්දීමේ ප්‍රශ්නයට දෙවරක් ඔබට සවන්දිය හැකි අතර ඉන් පසු එම ප්‍රශ්නයට ඔබට නැවත සවන්දිය නොහැකිය.


– ප්‍රශ්නයට සවන් දෙන කාල සීමාව තුළ ඊළඟ ප්‍රශ්නය සඳහා යොමු වීමට නොහැකි වේ.




සවන්දීමට පෙර | සවන්දීම | සම්පූර්ණ සවන්දීමෙන් පසුව

# 5. විභාගය පැවැත්වීම

⑤ වාදනය (Play) බොත්තම ක්ලික් කළ විට ප්‍රශ්නය අඛණ්ඩව දෙවරක් වාදනය වේ. ඉන් පසු පිළිතුරු තෝරා සළකුණු කරන්න.




※ සැම විටම earphones සම්බන්ධ වී ඇත්දැයි පරීක්ෂා කරන්න.
Earphones සම්බන්ධ වී නැති නම් සවන්දීමේ ප්‍රශ්න වලට සවන්දිය නොහැකි වේ.

# 5. විභාගය පැවැත්වීම


## විභාග පරික්ෂකගේ කාර්යයන්

**විභාග අපේක්ෂකයා හඳුනා නොගත් විට**




**ආසනයෙන් ඉවත් නොවිය යුතුය.**

**විභාග අපේක්ෂකයා වට පිට හිස ඔසවා බලන විට**





**හිසි ඔසවා වටපිට නොබැලිය යුතුය.**

# 5. විභාගය පැවැත්වීම

## පිළිතුරු ඉදිරිපත් කිරිම

※ විභාගය ආරම්භ වී මිනිත්තු 30 කට පසු ව submit answer ක්ලික් කළ හැකිය. ( මිනිත්තු 20 ක් ඉතිරිව ඇති විට)

⑥ සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දීමෙන් පසු, Submit answer ක්ලික් කරන්න.




⑦ පිළිතුරු ලබා දීමට එකඟ වූ පසු, පිළිතුරු ලබා දිය හැකිය.

**අවධානය**

– ඔබ පිළිතුරු ඉදිරිපත් කළ පසු(submit answer) ලබා දුන් පිළිතුර වෙනස් කළ නොහැක’

– විභාග කාලය අවසන් වූ පසු, ඔබ විසඳුම් ලබා දුන් ප්‍රශ්න සඳහා පමණක් අදාළ පිළිතුරු ස්වයංක්‍රීයව යොමු වනු ඇත.

# 6. වර්ණ දැක්ම පරීක්ෂණය


## වර්ණ දැක්ම ප්‍රශ්න 12

**පිළිතුරු ලබා දුන් පසු, වර්ණ දැක්ම පරීක්ෂණය සිදු කරනු ඇත.**

**වර්ණ දැක්ම ප්‍රශ්න 15 න් ප්‍රශ්න 12 ක් අහඹු ලෙස දිස් වනු ඇත.**

- සෑම ප්‍රශ්නයකට කාලය මිනිත්තු 2 තත්පර 30 ක් වන අතර විසඳා නොමැති ප්‍රශ්න වැරදි ලෙස සලකුණු කරනු ඇත.
- ප්‍රශ්න 07 කට නිවැරදි පිළිතුරු ලබා දුන් විට පරීක්ෂණය සමත් ලෙස අවසන් වේ,
- ප්‍රශ්න 5 කට වැරදි පිළිතුරු ලබා දුන් විට පරීක්ෂණය අසමත් වේ.
- විශේෂ කොරියානු පරීක්ෂණය සඳහා වර්ණ දැක්ම පරීක්ෂණය අදාළ නොවේ.

**① වම්පස ඇති රූපය බලා එහි ඇති අංකය දකුණු පසින් තෝරා සලකුණු කරන්න.**




# 6. වර්ණ දැක්ම පරීක්ෂණය

## වර්ණ දැක්ම ප්‍රශ්න 12

② ඊළඟ ප්‍රශ්නය සඳහා OK බොත්තම ක්ලික් කරන්න





③ ප්‍රශ්නය මඟහැර ගිය (skip) හොත් වැරදි ලෙස සලකුණු කරනු ලැබේ.




# 7. විභාගයේ අවසානය


## විභාගයේ අවසානය

පිළිතුරු ඉදිරිපත් කළ පසු විභාගය අවසන් වේ. ඔබේ ලකුණු පරීක්ෂා කර විභාග පරීක්ෂක උපදෙස් ලබා දෙන තුරු රැඳී සිටින්න.




ලකුණු අනාවරණය කර නැත.




ලකුණු අනාවරණය කර ඇත.

ස්තූතියි.